**CETRAC**
TO GO BEYOND

# ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය
நிர்மாண இயந்திர உபகரண பயிற்சி நிலையம்
## CONSTRUCTION EQUIPMENT TRAINING CENTRE
No 17, D P Wijesinghe Mawatha, Pelawatta, Battaramulla. Sri Lanka.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சு
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING

CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY


| මගේ අංකය. / எனது இல. / My No. | CE/WS/25/01 | ඔබේ අංකය. / உமது இல. / Your No. | | දිනය. / திகதி / Date | 2025-01-08 |
|---|---|---|---|---|---|

Deputy Chief Secretary (Personnel &Training)

Management Development & Training Unit Sabaragamuwa

මහත්මයාණෙනි/ මහත්මියණි,

**<u>රියදුරන් සඳහා එක් දින වැඩමුළුව</u>**
**<u>2025 පෙබරවාරි 20</u>**

අප ආයතනය මගින් පවත්වනු ලබන **"විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම"** එක් දින වැඩමුළුව මගින් දැනට රියදුරු මහතුන් 7500 කට අධික පිරිසකට පුහුණුව ලබා දී ඇති අතර ඒ සඳහා දැඩි ඉල්ලුමක් ලැබී ඇත. ඒ අනුව පවතින විශාල ඉල්ලුම මත එම වැඩමුළුව **2025 පෙබරවාරි 20** දින නැවත පැවැත්වීමට සැලසුම් කර ඇත.

මෙම වැඩමුළුව මගින් රිය පැදවීමේදී අනුගමනය කල යුතු විද්‍යාත්මක කරුණු හා පිරිමැසුම්දායක ලෙස රිය පැදවීම කෙරෙහි රියදුරන්ගේ අවධානය යොමු කරනු ඇත. මෙහිදී අවම ඉන්ධන පරිභෝජනය පමණක් නොව වාහනයේ සෑම කොටසකම උපරිම ක්‍රියාකාරිත්වය හා දිගු කල් පැවැත්ම පිළිබඳවද රියදුරන් දැනුවත් කරනු ඇත.

මීට අමතරව මෙම වැඩමුළුවේදී මාර්ග නීති, සංඥා සහ රියදුරන්ගේ වගකීම් මෙන්ම ආචාරධර්ම පිළිබඳවද ආරක්ෂිත රිය පැදවීම පිළිබඳවද ඉතා වටිනා දේශන පවත්වනු ඇත.

ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානයේ හා ශ්‍රී ලංකා රථ වාහන පොලිසියේ මනා පළපුරුද්දක් සහිත දේශකවරුන් වැඩමුළුව මෙහෙයවනු ලබයි.

**වැඩමුළුව අවසානයේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) මගින් සහතික පත්‍රයක් පිරිනමනු ලැබේ.**

**දින** - 2025 පෙබරවාරි 20

**ස්ථානය** - සීට්‍රැක් ශ්‍රවණාගාරය,
ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය,
අංක 17, ඩී පී විජේසිංහ මාවත, පැලවත්ත, බත්තරමුල්ල.

**කොන්ත්‍රාත් ආයතන ලියාපදිංචියේදී හා අළුත් කිරීමේදී ලකුණු ප්‍රමාණය ඉහළ නංවන "නිරන්තර නිපුණතා සංවර්ධන ලකුණු" (CCD Points) 10ක් සහභාගිවන්නන් නියෝජනය කරන ආයතන වෙත පිරිනැමේ.**

**අය කිරීම - එක් අයකු සඳහා රු 6,000.00 (ලිපි ද්‍රව්‍ය හා ආහාරපාන සහිතව)**

මෙම වැඩමුළුව සඳහා ඔබ ආයතනයේ සහභාගීත්වය අපේක්ෂා කරන අතර ඒ සඳහා මේ සමග අමුණා ඇති පැමිණීම තහවුරු කිරීමේ පත්‍රිකාව පුරවා නොපමාව අප වෙත එවා ඔබ ආයතනයේ සහභාගීත්වය ලියාපදිංචි කර ගත හැක. ගෙවීම් එදිනට හෝ ඊට පෙර කල යුතු අතර චෙක්පත් මගින් ගෙවීම් කරන්නේ නම් **"සභාපති, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය"** (Chairman – CIDA) නමට චෙක්පත් යොමු කල යුතුය.

ඔබ මේ පිළිබඳව දක්වන උනන්දුව ඉතා අගය කොට සලකන අතර **011-2784413/ 071-8201470** මගින් "සුලක්ඛනා වනිගාබඩු" **අමතන්න. ෆැක්ස් 011-2784411**

ස්තූතියි
මෙයට - විශ්වාසී,

නියෝජ්‍ය අධ්‍යක්ෂ
**ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය**

අ/කළේ; වරලත් ඉංජි. නිමන්ති ජයකොඩි
අධ්‍යක්ෂ (ඉ. යා. සේ.)
ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය


Director : 011-2787341 Manager : 011-2784412 Training : 011-2786829
Office : 011-2784413 Fax : 011-2784411 Email : cetrac@sltnet.lk

## අයදුම් පත්‍රය

• විද්‍යාත්මක පිරිමැසුම්දායක හා ආරක්ෂිත රිය පැදවීම

**එක් දින වැඩමුළුව 2025-02-20**

අයදුම්කරුවන්ගේ නම් :

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................
5. ..........................................................................................
6. ..........................................................................................
7. ..........................................................................................
8. ..........................................................................................
9. ..........................................................................................
10. ..........................................................................................

ආයතනයේ නම හා ලිපිනය :

..............................................................

..............................................................

..............................................................

ආයතනික නිල මුද්‍රාව තබන්න.
(ඇත්නම්)

දැනුම් දෙන නිලධාරියාගේ

නම :..............................................................

තනතුර :..............................................................

අත්සන :..............................................................

දුරකථන :............................ ෆැක්ස් ....................................

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)

# එක් දින වැඩමුළුව
## 2025-02-20

03 FEB 2025

### රියදුරන් සඳහා
### විද්‍යාත්මක පිරිමැසුම්දායක හා ආරක්ෂිත රිය පැදවීම




**ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය**
අංක : 17, ඩී පී විජේසිංහ මාවත, පැලවත්ත, බත්තරමුල්ල

**වැඩමුළුව අවසානයේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) මගින් සහතික පත්‍රයක් පිරිනමනු ලැබේ.**

> **කොන්ත්‍රාත් ආයතන ලියාපදිංචියේදී හා අළුත් කිරීමේදී ලකුණු ප්‍රමාණය ඉහළ නංවන "නිරන්තර නිපුණතා සංවර්ධන ලකුණු" (CCD Points) 10 ක් සහභාගීවන්නන් නියෝජනය කරන ආයතන වෙත පිරිනැමේ.**

වැඩි විස්තර සඳහා
**සුලක්ඛනා වනිගබඩු**
වෙලි : 011-2784413 / 071-8201470 **ෆැක්ස්** : 011-2784411
ඊ මේල් : cetractrg@gmail.com

## අන්තර්ගතය

### විද්‍යාත්මක හා පිරිමැසුම්දායක රිය පැදවීම

- වාහන පැදවීමේ වැරදි භාවිතයන්ගෙන් වැලකීම
- නවීන මෝටර් රථ උපකරණ නිවැරදිව භාවිතා කිරීම
- පිරිමැසුම්දායක ධාවන රටාව
- වාහනයට පටවන බර හා ටයර ආයුකාලය වෙනස් වීම
- වාහන බැටරියක උපරිම ආයු කාලය ලබාගැනීම
- වාහන නිසි කල සේවා කිරීමේ වැදගත් කම
- අවම ඉන්ධන පරිභෝජනය සහිත ධාවන වේගය
- ධාවනයේදී වායු ප්‍රතිරෝධය අවම කර ගැනීම
- ලැසි දිවුම් කාලය අවම කිරීම
- දිනපතා කළ යුතු පරීක්ෂාවන් සිදු කිරීම

### ආරක්ෂිත රිය පැදවීම හා නීතිරීති

- මාර්ග නීති, සංඥා හා වේග සීමා වලට අනුකූලව රිය පැදවීම
- මාර්ග නීති උල්ලංඝනය කිරීමෙන් ලැබිය හැකි සුළු/දැඩි දඬුවම්
- නව මෝටර් රථ ආඥා පනතේ විධිවිධාන
- අධිවේගී මාර්ග සඳහා පනවා ඇති නීතිරීති
- බලපත්‍රයේ වලංගු කාලය හා ප්‍රසාද දීමනා
- මාර්ග සකසා ඇත්තේ එය-භාවිතා කරන සියළු දෙනා වෙනුවෙන් බව සිහි තබාගෙන කටයුතු කළ යුතු ආකාරය
- අළුතින් හඳුන්වා දී ඇති මාර්ග සංඥා

### රියදුරකුගේ වගකීම් හා ආචාර ධර්ම

- අනෙකුත් රියදුරන් සමග සුහදශීලීත්වයෙන් යුතුව රිය පැදවීම
- තම වෘත්තිය ගරුත්වය රැකෙන ආකාරයෙන් කටයුතු කිරීම
- වාහනයේ ගමන් කරන අයගේ ගෞරවය හා ආරක්ෂාව සුරැකීම
- රාජකාරිය සඳහා නීතියෙන් බැඳී සිටින බව දැන සිටීම
- වැටුපට සරිලන සේවාවක් ලබා දීමට කටයුතු කිරීම

| | |
|---|---|
| **මාධ්‍යය** | : **සිංහල** |
| **පාඨමාලා ගාස්තුව** | : රු 6,000.00<br>**(අත්පොත් හා ආහාරපාන ඇතුළුව)** |
| **වේලාව** | : පෙ.ව. 9.00 - ප.ව. 4.00 |
| **ස්ථානය** | : **සීට්‍රැක් දේශන ශාලාව** |